ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය
இலங்கை கொடுகடன் தகவல் பணியகம்
CREDIT INFORMATION BUREAU OF SRI LANKA

# MyReport

## උපදේශක අත්පොත

### මාර්ගගත **(Online)** ක්‍රමයෙන්
### ස්වකීය ණය තොරතුරු වාර්තාව **(iReport)**
### ලබාගැනීම

**Version – 1.0**

මෙම ප්‍රකාශනයෙහි ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයට අදාල රහස්‍ය හෝ බුද්ධිමය දේපල ගණයට අයත් හෝ නීතියෙන් ආරක්ෂිත තොරතුරු අන්තර්ගත විය හැක. මෙහි අඩංගු තොරතුරු හෝ තොරතුරක් සාවද්‍ය ලෙස අර්ථකථනය කිරීම හෝ වටහාගැනීම හෝ භාවිතය හේතුවෙන් ඇති විය හැකි යම් හානි හෝ අලාභයන් සඳහා කාර්යාංශය කිසිසේත්ම වගකියනු නොලැබේ. අවශ්‍ය හා අදාල සෑම අවස්ථාවන්හිදීම මෙහි අඩංගු තොරතුරු පිළිබඳ වැඩිදුර විමසීම හෝ තහවුරු කරගැනීම සඳහා කාර්යාංශයේ සහය හෝ උපදෙස් පතන ලෙස ඔබට අවධාරණය කර සිටිමු. මෙහි අඩංගු කිසිදු තොරතුරක් හෝ ඉන් කොටසක් කාර්යාංශයේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව කිසිදු අයුරකින් හෙළිකිරීම හෝ පිටපත් කිරීම හෝ නැවත මුද්‍රණය කිරීම හෝ බෙදා හැරීම සපුරා තහනම් වේ. මෙම ප්‍රකාශනයෙහි දැක්වෙන සියළුම තිර සටහන්වල උපුටාගැනීම්, පරිශීලනය කරනු ලබන ණය තොරතුරු වාර්තාවෙහි දැක්වෙන තොරතුරු සමග වෙනස්විය හැකි බවත් එම තිර සටහන් හුදෙක් නිදර්ශනය කිරීම සඳහා යොදා ඇති බවත් දන්වා සිටින අතර, ණය තොරතුරු කළමනාකරණ පද්ධතිය (CIMS) තුළ පවතින කිසිදු පුද්ගලයෙකුගේ හෝ ආයතනයක කිසිදු තොරතුරක් මෙමගින් ප්‍රදර්ශනය හෝ නියෝජනය නොකරන බවත් අවධාරණය කර සිටිමු.

**සියළු හිමිකම් ඇවිරිණි.**
**ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය 2023.**

| පිටපත | දිනය | සටහන |
| --- | --- | --- |
| 1.0 | 2023 ජනවාරි මස 15 | **මුල් පිටපත -**<br>මාර්ගගත ක්‍රමය යටතේ **myreport.crib.lk** වෙත පිවිසීමෙන් ස්වකීය ණය තොරතුරු වාර්තාව (පුද්ගල හා ව්‍යාපාරික) ලබාගන්නා ආකාරය සහ එහි ක්‍රියාකාරිත්වයන් සවිස්තරාත්මකව සඳහන් කිරීම. |

**අන්තර්ගතයන්**

පිටු අංකය.

**1.** හැඳින්වීම ---------- **2**
**2.** ලියාපදිංචිය ---------- **2**
**3.** අයකුම කාණ්ඩ ---------- **2**
**4.** පිවිසීම ---------- **3**
**5.** හසුරුවාගැනීම් ---------- **4**
**6.** මුල් පිටුව ---------- **4**
**7.** සේවාවන් ---------- **6**
**8.** ඇඟවීම් ---------- **7**
**9.** උපකාරක ---------- **8**
**10.** පැතිකඩ ---------- **8**

## **1.** හැඳින්වීම

**"MyReport"** යනු මාර්ගගත ක්‍රමය යටතේ ස්වකීය ණය තොරතුරු වාර්තාව ලබාගැනීම සඳහා ලියාපදිංචිවීම සහ එමගින් ස්වකීය ණය තොරතුරු වාර්තාව මාර්ගගත ක්‍රමයෙන් ලබාගැනීමට එහි ලියාපදිංචි පරිශීලකයන් (පුද්ගලයන් හෝ ආයතනයන්) සඳහා නිර්මාණය කර ඇති යෙදුමකි. **https://myreport.crib.lk** යන වෙබ් ලිපිනය වෙත පිවිසීමෙන් පහත සඳහන් ස්වකීය ණය තොරතුරු වාර්තාවන් මාර්ගගත ක්‍රමයෙන් ලබාගත හැක.

- **iReport** - ස්වකීය ණය තොරතුරු වාර්තාව.
- **iReport Plus** - ණය ලකුණ (Credit Score) සහිත, ස්වකීය ණය තොරතුරු වාර්තාව.

**"MyReport"** යෙදුමේ ප්‍රවේශයන්, පරිශීලක ගිණුම් මත පදනම්ව කළමනාකරණය කෙරේ. ලියාපදිංචි වී ඇති බලයලත් පරිශීලකයින්ට පමණක් එය භාවිතා කිරීමට අවසර ඇත. ලියාපදිංචි කිරීමේ අයදුම් පත්‍රයෙහි ඉල්ලා ඇති අවශ්‍ය තොරතුරු ලබා දීමෙන් ලියාපදිංචි ක්‍රියාවලිය හරහා පරිශීලක ගිණුම් සකස් කෙරේ. ලියාපදිංචි කිරීමේ අයදුම්පත කාර්යාංශයෙන් හෝ කාර්යාංශයේ වෙබ් අඩවිය **www.crib.lk** වෙත පිවිසීමෙන් ද ලබාගත හැක.

**සැ. යු.:** **"MyReport"** යෙදුමේ සහ User Interface (UI) හි අන්තර්ගතයන් හා ක්‍රියාකාරිත්වයන් තනි පුද්ගල පරිශීලකයින්ට මෙන්ම ආයතනික පරිශීලකයින්ට ද සමාන බැවින්, තනි පුද්ගල පරිශීලකයින් සඳහා ඇති අන්තර්ගතයන් හා ක්‍රියාකාරිත්වයන් පමණක් මෙම උපදේශක අත්පොත මගින් විස්තර කෙරේ.

## **2.** ලියාපදිංචිය

අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද ලියාපදිංචි කිරීමේ අයදුම්පත, කාර්යාංශය වෙත ඉදිරිපත් කල යුතුය.

- සම්පූර්ණ කරන ලද පුද්ගල අයදුම්පත, හැඳුනුම්පත සමඟ ලියාපදිංචිය සඳහා කාර්යාංශය වෙත පෞද්ගලිකව පැමිණ ඉදිරිපත් කළ යුතුය.

- සම්පූර්ණ කරන ලද ආයතනික අයදුම්පත, අවශ්‍ය ලියකියවිලි සමඟ (අයදුම්පතෙහි සඳහන් කර ඇති) ඉල්ලුම් කරනු ලබන ආයතනයෙහි ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකුවෙහි හෝ බැංකු ශාඛාවෙහි සිටින කාර්යාංශය විසින් බලය දී ඇති බැංකු නිලධාරියෙකු වෙත ඉදිරිපත් කර සහතික කරගැනීමෙන් අනතුරුව ලියාපදිංචිය සඳහා කාර්යාංශය වෙත පෞද්ගලිකව පැමිණ ඉදිරිපත් කල යුතුය. (වැඩිදුර විස්තර සඳහා ආයතනික අයදුම් පතෙහි ඇති උපදෙස් බලන්න)

## **3.** අයකුම කාණ්ඩ


පහත දක්වා ඇති අයකුම කාණ්ඩ තුනක් (03) යටතේ, පුද්ගල හෝ ආයතනික පරිශීලකයින් හට ස්වකීය ණය තොරතුරු වාර්තාව ලබාගැනීමට "MyReport" මගින් පහසුකම් සලසා ඇත. කාර්යාංශය විසින් ලබාදෙනු ලබන තොරතුරු හා සේවාවන් මත පදනම්ව එම අයකුම කාණ්ඩ සඳහා වන ගාස්තු (Subscription Fee) සකස් කර ඇති අතර එය සැලසුම් කර ඇත්තේ එක් (01) මාසයක කාලයක් තුල එක් (01) සේවාවක් ලබාගැනීම සඳහා පමණි.

1. මූලික අයකුම කාණ්ඩය - iReport පමණක් ලබා ගත හැක.
2. සම්මත අයකුම කාණ්ඩය - iReport Plus පමණක් ලබා ගත හැක.
3. විශේෂිත අයකුම කාණ්ඩය - iReport Plus සමග ඇඟවීම් (Alerts) ද ලබා ගත හැක.


**Alerts** - කාර්යාංශය විසින් ඉලෙක්ට්‍රොනික ගත ක්‍රමයෙන් (කෙටි පණිවුඩ (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල (Email) මගින්) ලබාදෙනු ලබන Alert සේවාව, අගය එකතුකළ සේවාවක් ලෙස ලබාගැනීමට ලියාපදිංචි වී ඇති පරිශීලකයින් හට ලබාදෙන අතර, ඔවුන්ගේ ණය තොරතුරු වල හෝ වාර්තා කර ඇති දත්ත වල සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම් හෝ සිද්ධීන් පිළිබඳව පරිශීලකයින් හට දැනුම් දීම මෙමගින් සිදු කෙරේ.

## 4. පිවිසීම

1. https://myreport.crib.lk යන වෙබ් ලිපිනය වෙත පිවිසීම.
2. **"SIGN IN"** වෙත පිවිසීම,
3. **"පරිශීලක නාමය"** සමග **"මුර පදය"** ඇතුලත් කිරීම. (ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ දී ලබාගන්න ලද)




4. පරිශීලනය කරන්නාගේ තොරතුරු ලියාපදිංචි කර ඇති වුවත්, කාර්යාංශය විසින් එම තොරතුරු තහවුරු (Authorize) කර නොමැති අවස්ථාවන්හි දී, පහත සඳහන් පණිවිඩය, ප්‍රදර්ශනය කරයි.




5. පරිශීලකයන් හට ලබා දී ඇති මුරපදය අමතක වී ඇති අවස්ථාවන්හි දී පිවිසුම් තිරයෙහි ඇති "**Forgot your password**" මත ක්ලික් කිරීමෙන් අනතුරුව ලැබෙන උපදෙස් අනුගමනය කිරීමෙන් තම මුරපදය නැවත සකස් කරගත හැක. මුරපදයක තිබිය යුතු පරාමිතීන් පිළිබඳ විස්තර, මුරපදය වෙනස් කිරීමට ඇති තිරයෙහි දක්වා ඇත.


**මුරපදයක අන්තර්ගත නියමයන්**

- මුරපදය කල් ඉකුත් වීම - වෙනස් කරන ලද මුරපදයක් දින හැටකට (60) පසු කල් ඉකුත්වේ.
- අසාර්ථක පිවිසීම් උත්සාහයන් තුනකට (03) පසුව පරිශීලක ගිණුම අක්‍රිය වේ.
- මුරපදය සඳහා කිසිවිටෙකත් පිවිසීම සඳහා ඇති පරිශීලක නාමය හෝ ගිණුමේ නාමයන් භාවිතා නොකළයුතු අතර, සම්පූර්ණ ශබ්ද කෝෂ වචන සහ පරිශීලකයාගේ සම්පූර්ණ නමෙහි යාබද අක්ෂරයන්ද භාවිතා නොකළයුතු වේ.

## 5. හසුරුවාගැනීම්

"MyReport" යෙදුම පහත සඳහන් කොටස් වලින් සමන්විත වේ.

1. හසුරුවාගැනීම - මෙමගින් ප්‍රධාන මෙනුවලට පිවිසීමටත් සහ ණය තොරතුරු වාර්තාව බාගත (download) කිරීමටත් හැකියාව ඇත.
2. පිටු අන්තර්ගතය - තෝරාගත් මෙනුවට අදාල කොටසෙහි අන්තර්ගතය.
3. පාදකය - පිටපතෙහි (version) තොරතුරු.
4. භාෂාව තෝරාගැනීම.
5. පරිශීලකගේ මූලික තොරතුරු.
6. ඉවත්වීම.




## 6. මුල් පිටුව

මෙය පහත සඳහන් ප්‍රධාන කොටස් හතරකින් (04) සමන්විත වේ.

1. **Dashboard** - උපකාරක පුවරුව මගින් ස්වකීය ණය තොරතුරු, සාරාංශ ගත කොට ඉදිරිපත් කරයි. එමගින් සියළුම තොරතුරු ඉක්මනින් අධ්‍යනය හා පරිශීලනය කිරීමට පරිශීලකයන්හට හැකියාව ලැබේ.

2. **Subject info** - මෙම තීරයෙහි ණයදෙන ආයතන විසින් වාර්තා කළ ආකාරයට පරිශීලක (පුද්ගලයෙකු හෝ ආයතනයක්) හඳුනාගැනීමේ තොරතුරු අන්තර්ගතවේ.

3. **Scoring** - මෙහිදී ණය ලකුණු (Credit Score), අවධානම් අගය (Risk Grade), ප්‍රවනතාවය (Score Trend) සහ පසුගිය මාස 12 ක කාලය තුල ණය ලකුණු වෙනස් වූ ආකාරය (Score History) ප්‍රස්ථාරයක් ලෙස පෙන්වන අතර ණය ලකුණු සහ අවධානම් අගය සඳහා බලපා ඇති ප්‍රධාන හේතූන් සවිස්තරාත්මකව මෙහි දක්වා ඇත.

**4. Credit Facilities** - "Payments Profile Status" යටතේ, ලබාගෙන ඇති සියළුම සක්‍රිය සහ ගෙවා නිමි ණය පහසුකම් සියල්ලෙහිම සාරාංශයක් නිරූපණය කරන අතර "List of All Credit Facilities" යටතේ, ලබාගෙන ඇති එක් එක් ණය පහසුකම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු නිරූපණය වේ. වාර්තාකර ඇති ණය පහසුකම් සම්බන්ධ ආරවුල් ලියාපදිංචි කිරීමටද පරිශීලකයන්ට මෙමගින් අවසථාව ලැබේ.

List of All Contracts

| Contract Code | Role of Subject | Sector | Type of Contract | Contract Status | Phase of Contract | Total Sanctioned Amount |
|---|---|---|---|---|---|---|
| 0071412361-521 | MainDebtor | Banks | Overdraft | GrantedAndActivated | Open | 106 |
| 55049000000154006-1 | MainDebtor | Banks | CreditCard | GrantedAndActivated | Open | 500000 |
| 1260016301-26 | CoDebtor | Banks | Overdraft | Closed | Closed | 0 |
| **Total Sum On Page** | | | | | | **Rs 500,106.00** |

SHOW DETAILS

**5. Disputes** - දැනට ලියාපදිංචි කර ඇති ආරවුල් සම්බන්ධයෙන් සවිස්තරාත්මක තොරතුරු මෙමගින් නිරූපණය කෙරේ. එහි සඳහන් "Disputes Overview" වගුවේ ඇති "Details" අයිකනය මගින් එක් එක් ආරවුල සම්බන්ධයෙන් දක්වන ලද අදහස් සහ සන්නිවේදනයන් කවරේද යන්න පරිශීලකයන්හට දැන ගත හැකි වේ. තවද මෙමගින් නව ආරවුල් ලියාපදිංචි කිරීමටද පරිශීලකයින්හට අවස්ථාව ඇත.

Disputes Overview

| Reason | Status | Created | Updated | Closed |
|---|---|---|---|---|
| SettledNotUpdated | Assigned to Subscriber | 31-Jan-2022 | 31-Jan-2022 | |
| IncorrectAddress | Rejected | 31-Jan-2022 | 31-Jan-2022 | 31-Jan-2022 |
| NotRelevant | Assigned to Subscriber | 05-Apr-2022 | 05-Apr-2022 | |

DETAIL

**නව ආරවුල් ලියාපදිංචි කිරීම**

- ප්‍රථමයෙන් "**Create New Dispute**" මත ක්ලික් කලයුතුය.
- ආරවුල ලියාපදිංචි කලයුතු අයිතමය තෝරාගත යුතුය. (එය ණය මුදලක් හෝ අගරු චෙක්පතක් හෝ වෙනත් තොරතුරක් හෝ විය හැක).
- ආරවුල අයත් වර්ගය තෝරාගත යුතුය.
- ආරවුල පිළිබඳ විස්තරය ඉදිරිපත් කලයුතුය.
- ආරවුල සම්බන්ධයෙන් ඇති අනෙකුත් ඇමුණුම් (අවශ්‍ය නම් පමණක්) ඉදිරිපත් කලයුතුය.

1/2 **Select Dispute entity**

| | Code | Dispute IDs | Type | Subscriber | Role |
|---|---|---|---|---|---|
| ○ | | | Subject | | |
| ● | 5504900000154006-1 | 3, 33 | Contract | Commercial Bank of Ceylon | MainDebtor |
| ○ | 000002116637-68 | 32, 34 | Contract | Commercial Bank of Ceylon | Guarantor |

**දැනට යොමු කර ඇති ආරවුල් යාවත්කාලීන කිරීම**

- පරිශීලකයන් විසින් යොමු කර ඇති ආරවුල් වල විස්තර “Disputes Overview” මගින් ලබාගත හැකි අතර, ඒවා යාවත්කාලීන කිරීමටද හැකියාව ඇත. දැනට කාර්යංශයට යොමු කර ඇති ආරවුල් සම්බන්ධයෙන් පරිශීලකයන්හට අදහස් දැක්විය නොහැක.

## 7. සේවාවන්


මෙය පහත සඳහන් කොටස් දෙකකින් සමන්විත වේ:

### 1. ස්වකීය ණය තොරතුරු වාර්තාව

මෙහිදී පරිශීලකයින්හට ස්වකීය ණය තොරතුරු වාර්තාව “DOWNLOAD REPORT” මගින් ජනනය කර ගත හැකි අතර “DOWNLOAD REPORT” වෙත පිවිසිය හැක්කේ සක්‍රීය අයකුම කාණ්ඩයක් ඇති අවස්ථාවන්හි දි හෝ එය භාවිතා කර නොමැති අවස්ථාවන්හි දි පමණි.


**ජනනය කර ඇති වාර්තාවන් වල විස්තර**

පෙර ජනනය කරන ලද ස්වකීය ණය තොරතුරු වාර්තාවන් වල විස්තර මෙහිදි දැකගත හැකි අතර, අවශ්‍ය නම් එම වාර්තාවන් නැවත ලබාගැනීමටද හැකියාව ඇත.





### 2. තෙවන පාර්ශවීය යොමු කිරීම

මෙමගින් පරිශීලකයින් විසින් ලබාගන්නා ලද ස්වකීය ණය තොරතුරු වාර්තාව, ඔවුන්ගේ අභිමතය පරිදි, වෙනත් තුන්වන පාර්ශවයක් වෙත යොමුකිරීමට හැකියාවක් ඇත. පරිශීලකයින් විසින් එම වාර්තාව යොමු කලයුතු තුන්වන පාර්ශවයේ ඊමේල් ලිපිනය (Email) ලබාදියයුතු වන අතර, එමගින් යොමු කරනු ලබන ස්වකීය ණය තොරතුරු වාර්තාව සබැඳියක් ලෙස (Link) තුන්වන පාර්ශවයේ ලබන්නා වෙත යොමු වේ.




**සැ. යු.:** පරිශීලකයින් විසින් යොමුකරන ලද සබැඳිය (Link) තුන්වන පාර්ශවය විසින් භාවිතා කර නොමැති අවස්ථාවන්හි දි (Click කර නොමැති නම්) එම සබැඳිය දින හතක (07) කාලයක් සඳහා පමණක් වලංගු වේ. එසේම යොමුකරන ලද සබැඳිය (Link) තුන්වන පාර්ශවය විසින් භාවිතා කර ඇත්නම් (Click කර වාර්තාව ලබාගෙන ඇත්නම්) එම සබැඳිය දිනක (01) කාලයක් සඳහා පමණක් වලංගු වේ.




## 8. ඇඟවීම්

**"Alerts"** යනු, වාර්තා කර ඇති දත්ත වල සිදු වී ඇති ප්‍රධාන වෙනස්කම් හෝ සිද්ධීන් පිළිබඳව කෙටි පණිවුඩ (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල (Email) මගින් පරිශීලකයින් හට ලබාදීමයි. ලබාදෙනු ලබන ඇඟවීම් පහත දක්වා ඇත.

- ණය තොරතුරු පිළිබඳ නව විමසීමකදී - ණය දෙන ආයතනයක් විසින් ඔබට අදාල ණය තොරතුරු වාර්තාව ලබාගත් අවස්ථාවකදී.
- නව ණය මුදලක් වාර්තා කිරීමකදී - ඔබ ලබාගත් නව ණය මුදලක් අදාල ණය දෙන ආයතනය විසින් වාර්තා කර ඇති අවස්ථාවකදී.
- ණය ලකුණේ අගය වෙන්ස්වීම්කදී - ඔබගේ ණය ලකුණේ අගය (Credit Score) වෙනස් වී ඇති අවස්ථාවකදී.
- හිඟ දින ගනනෙහි වෙනස්වීමකදී - වාර්තා කර ඇති යම් ණය මුදලක, වාරිකය ගෙවීම මගහැරි අදාල හිඟ දින ගනන වෙනස් වී ඇති අවස්ථාවකදී.
- ආරවුල් යාවත්කාලීන වීමේදී - ඔබ විසින් යොමු කරන ලද දත්ත පිළිබඳ ආරවුල් යාවත්කාලීන වීමකදී.

**සැ. යු.:** ප්‍රවේශ වූ හෝ කියවා ඇති ඇඟවීම් අළු (Gray) වර්ණයෙන් සහ ප්‍රවේශ නොවූ හෝ කියවා නොමැති නව ඇඟවීම් කළු (Black) වර්ණයෙන් ද දක්වා ඇත.

## 9. උපකාරක


කාර්යාංශය විසින් පරිශීලකයින්ගේ පහසුව සඳහා සකස්කර ඇති පරිශීලකයන් විසින් නිතර අසනු ලබන ප්‍රශ්නවලට යොමු වන FAQ කොටස මෙහි අන්තර්ගත වේ.


## 10. පැතිකඩ

මෙය කොටස් පහකින් (05) සමන්විත වේ.


1. **විශ්ලේෂණය** - මෙහි අන්තර්ගතයන්ගේ සාරාංශයක් දක්වන අතර මෙමගින් ඒහා සම්බන්ධ වියහැක.


2. **අයක්‍රම කාණ්ඩය** - මෙමගින් දැනට භාවිතා කරනු ලබන අයක්‍රමය, එහි අවසන් වන දිනය, එම අයක්‍රමය වෙනස් කිරීම හෝ දැනට සක්‍රීයව ඇති අයක්‍රමය දීර්ග කිරීමට ද අවස්ථාව සැලසේ. පෙර භාවිතා කරන ලද අයක්‍රමයන් පිළිබඳ විස්තර ද මෙහිදී පරිශීලකයන් හට ලබාගත හැක.







**අයක්‍රමය වෙනස් කිරීම -** මෙමගින් දැනට භාවිතා කරනු ලබන අයක්‍රම කාණ්ඩයෙහි ශ්‍රේණිය ඉහල දැමීමට හෝ පහල දැමීමට හැකියාව ලැබෙන අතර වෙනස් කළ අයක්‍රමය වහාම ආරම්භ කරන්නේද නැතහොත් වත්මන් අයක්‍රමය අවසන් වූ පසු ආරම්භ කරන්නේද යන්න පරිශීලකයා විසින් තෝරාගත යුතු වේ.




**3. සැකසුම්** - මෙහිදි පරිශීලකයින්හට, ලියාපදිංචි වන අවස්ථාවේ දි ලබාදෙන ලද තොරතුරු වලින් සීමිත තොරතුරු පමණක් වෙනස් කිරීමට හැකියාවක් ඇති අතර පරිශීලක නාමය සහ මුරපදය වෙනස් කිරීමට ද මෙහිදි හැකියාව ඇත. විද්‍යුත් ලිපිනයක් වන පරිශීලක නාමය වෙනස් කිරීමකදි විද්‍යුත් ලිපිනය තහවුරු කරගැනීම අනිවාර්යය වේ.

**4.**




**5. දැනුම්දීම** - මෙහිදී විද්‍යුත් තැපැල මගින් හෝ කෙටි පණිවුඩ මගින් ලැබෙන සේවාවන් හෝ දැනුම්දීම් සක්‍රීය කිරීම හෝ අක්‍රිය කිරීම සඳහා පරිශීලකයින්හට අවස්ථාව හිමි වේ.

**6. ගෙවීම් රිසිට් පත්** - පරිශීලක විසින් ලබාගන්නා ලද ස්වකීය ණය තොරතුරු වාර්තාවන් සම්බන්ධයෙන් කරන ලද ගෙවීම් පිළිබඳ විස්තර මෙහිදි ලබාගත හැකි අතර වාර්තාවන් සඳහා පෙර කරන ලද ගෙවීම් සඳහා නිකුත් කරන ලද රිසිට් පත සහ ඉන්වොයිසිය මෙහිදී PDF ආකාරයෙන් නැවත ලබාගත (Download) හැක.




**7. ප්‍රවේශනය** - මෙහිදී පරිශීලකයා විසින් MyReport යෙදුමට ප්‍රවේශ වීම පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව දක්වා ඇත.